## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව - 2017

-----------------------------------------------------------------------

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ (බැංකුව) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2003 අංක 15 දරන පනතින් හා 2011 අංක 45 දරන පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනතේ 26(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (“මණ්ඩලය”) වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන
----------------

### 2.1 මතය
-------

මූල්‍ය ප්‍රකාශනවලින්, 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව
---------------------------------------------------------------------------

1988 අංක 30 දරන බැංකු පනත හා ඊට පසු වන සංශෝධනවල අවශ්‍යතාවයන්වල දක්වා ඇති තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇත.

### 2.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම
---------------------------------------------

පහත දැක්වෙන විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති ලිඛිත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

| අයිතමය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| බැංකුවේ ඇති මුදල් | | |
| - Dutch Bank Sinking | 454,106 | අදාළ බැංකුවේ ඍජු සනාථ කිරීම්, බැංකු ප්‍රකාශන සහ බැංකු සැසඳුම් ප්‍රකාශන |
| - බීඕසී (BOC) රැස්කිරීමේ ගිණුම (Mit) | 258,526 | |
| - බීඕසී (BOC) මහනුවර ශාඛාව | 38,628 | |
| - බීඕසී (BOC) මාතලේ ශාඛාව | (28,380) | |
| අනෙකුත් ආයතනවලට ගෙවිය යුතු ශේෂ | 93,872,309 | ශේෂ සනාථ කිරීම් |
| අනෙකුත් ආයතනවලින් ණය ගැනීම් | 500,000 | සුදු නෙළුම් ව්‍යාපාරය සමඟ ගිවිසුම |

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
----------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාන මාසික වාරික අතිරික්ත ගිණුමේ (Equal Monthly Installments (EMI) Excess Account) රු.29,785,012 ක්වූ වැඩිපුර ණය අයකර ගැනීම් වර්ෂයකට වැඩි කාලයක් ගනුදෙනුකරුවන්ට ආපසු ගෙවීමෙන් තොරව පැවතුණි.

(ආ) බැංකුවේ සාමාන්‍ය පරිචයක් ලෙස මුදල් සහ චෙක්පත් අත්තිකාරම් පිළිවෙලින් දින 14 ක් හා දින 22 ක් ඇතුළත නිරවුල් කළ යුතුය. කෙසේ වුවද, විවිධ කාර්යයන් සඳහා දුන් එකතුව රු.470,600 සහ රු.6,008,747 අත්තිකාරම් 2017 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් දින 23 සිට දින 278 ක් හා දින 17 සිට දින 181 ක කාල පරාසයක් තුළ නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට පොදු ලෙජරයේ ලාභාංශ ගිණුමේ හා වෙන්දේසි කරන ලද දේපල සඳහා ලද අත්තිකාරම් ගිණුමේ පැවති පිළිවෙලින් රු.4,567,738 ක් හා රු.2,238,028 ක් වූ දීර්ඝකාලීන හිඟ ශේෂ බැංකුව විසින් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඈ) රජයේ ණය පොලී පාලන නාමික ගිණුමේ (ලෙජර ගිණුම් අංක 1420100004) ශේෂය වර්ෂය අවසානයට ශුන්‍ය ශේෂයක් (zero) විය යුතු වුවද, 2017 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ රු.9,238,545 ක ශේෂයක් නිරවුල් කිරීමකින් තොරව පැවතුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1997 අංක 07 දරන නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනතේ IV කොටසේ 16(2) වගන්තිය | බැංකුවේ නිකුත් කළ (ප්‍රකාශිත) ප්‍රාග්ධනය රු.මිලියන 1,000 ක් විය යුතුය. කෙසේ වුවද 2017 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.962,092,936 ක් විය. |
| (ආ) | මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම සඳහා වන ප්‍රධාන සැලසුම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව (සීබීඑස්එල්) නිකුත් කල 2014 ජනවාරි 17 දිනැති අංක 02/17/402/0073/002 දරන විධානය | 2018 ජනවාරි 01 දිනට බැංකුවේ මූලික ප්‍රාග්ධනය රු.මිලියන 5,000 විය යුතු වුවද, මෙම අවශ්‍යතාවය සම්පූර්ණ කර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 396(ඇ) | නිකුත් කළ දින සිට මාස හයක් ඉක්ම වූ මුදල් නොකළ චෙක්පත් තිබේ නම්, එම චෙක්පත් බැංකුවට ඉදිරිපත් කළද මුදල් නොගෙවන බවට බැංකුවෙන් සනාථ කිරීම් ලබාගෙන එම චෙක්පත් අවලංගු කල බවට අදාළ ලෙජරවල වාර්තා කළ යුතුව ඇත. කෙසේ වුවද, බැංකුව මේ සම්බන්ධයෙන් අනුකූල වී නොතිබූ අතර 2017 දෙසැම්බර් මාසය සඳහා සකස් කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශනයේ මුදල් නොකළ චෙක්පත් දක්නට ලැබුණි. |
| (ඈ) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 හි ප්‍රතිපාදන<br>(i) 5.2.4 වගන්තිය | මුදල් වර්ෂය ආරම්භ වීමට මාස 03 කට පෙර කෙටුම්පත් අයවැය, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, 2017 වර්ෂය සඳහා වූ අයවැයට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2016 දෙසැම්බර් 20 දින ලබා දී තිබුණි. |

| | | |
|---|---|---|
| (ii) 9.2(ආ) සහ (ඇ) වගන්ති | | ආයතනය සඳහා අනුමත සංවිධාන සටහනක් හා අනුමත කාර්ය මණ්ඩල සැලැස්මක් තිබිය යුතු වන අතර එය මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතුය. කෙසේ වුවද, බැංකුව මෙම අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි. |
| (iii) 9.3.1 වගන්තිය | | සෑම රාජ්‍ය ව්‍යවසායක් සතුව සෑම තනතුරක් වෙනුවෙන් බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් තිබිය යුතු වන අතර, එය මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලයේ හා අදාළ අමාත්‍යාංශයේ අනුමැතිය ලබා දී තිබිය යුතුය. කෙසේ වුවද, එවැනි පරිපාටියක් බැංකුව සතුව නොතිබුණි. |
| (ඉ) | 2015 මැයි 25 දිනැති අංක 01/2015 හා 2016 ඔක්තෝබර් 27 දිනැති අංක 01/2015 (i) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | (i) රාජකාරී වාහන සඳහා හිමිකම් ඇති නිලධාරීන්හට කාර්යාල වාහනයක් භාවිතා කිරීම සඳහා හෝ රු.50,000 ක මාසික ප්‍රවාහන දීමනාව හා තනතුරට අදාළ වන මාසික ඉන්ධන දීමනාවක් ලබාගැනීම සඳහා හිමිකම් ඇත. කෙසේ වුවද, මෙයට අනුකූල නොවී එම වාහන හිමිකම් ඇති නිලධාරීන් සඳහා මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ අභ්‍යන්තර අනුමැතිය මත බැංකුව රු.300,000 වැඩිපුර ගෙවා තිබුණි. |
| | | (ii) චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලට අනුකූල නොවී රාජකාරී වාහන හිමිකම් ඇති නිලධාරීන් තිදෙනෙකුට වාහන දීමනාවලට අමතරව රියදුරු දීමනා ලෙස බැංකුව වාර්ෂිකව රු.540,000 ක් ගෙවා තිබුණි. |
| | | (iii) වාහන දීමනා සඳහා හිමිකම් ඇති නිලධාරීන්ට වාහන නඩත්තු කිරීම සඳහා ගෙවීම් කිරීමට අනුමැතිය ලබා නොදිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් නවදෙනෙකුට නඩත්තු වියදම් ලෙස බැංකුව රු.450,000 ගෙවා තිබුණි. තවද, චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලට අනුකූල නොවී අනුමත ඉන්ධන දීමනාවලට අමතරව නිලධාරීන් දහ හතර දෙනෙකු සඳහා රු.1,548,791 ක් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) | රජයේ මිලදී ගැනීම් මහ පෙන්වීම් සහ 2009 ජුනි 4 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඑෆ්/429(i) | බැංකුව මිලදී ගැනීමේ කටයුතු සඳහා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගැනීමකින් තොරව විශේෂිත මිලදී ගැනීම් අත්පොතක් භාවිතා කරනු ලබන අතර 2017 වර්ෂය තුළ රජයේ මිලදී ගැනීම් මහ පෙන්වීම් අනුගමනය කිරීම වෙනුවට එම අධිකාරිය නොලත් මහ පෙන්වීම භාවිතා කරමින් රු.මිලියන 74 ක් වටිනා අයිතම වර්ග 1311 ක් මිලදී ගෙන තිබුණි. |
| (උ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 133 වගන්තිය හා ඒ සඳහා වන සංශෝධන | (i) තනි පුද්ගලයින් හා සමාගම් වෙනුවෙන් රඳවා ගැනීමේ බදු අනුපාතය වූ පිළිවෙලින් සියයට 2.5 හා සියයට 10 වෙනුවට ප්‍රතිපාදන මතභේදයට තුඩු දෙන පරිදි බැංකුව තනි පුද්ගලයින් සඳහා සියයට 8 අනුපාතයක් හා සමාගම් සඳහා සියයට 2.5 හා සියයට 8 යන අනුපාත අදාළ කර තිබුණි.<br><br>(ii) මසකට රු.5,000 කට අඩු පොලියක් ගෙවා තිබූ සියළු ගිණුම්වලින් බැංකුව ආදායම් බදු අඩුකර තිබුණි. |
| (ඌ) | 2006 ඔක්තෝබර් 05 දිනැති අංක 1465/19 දරන රජයේ ගැසට් පත්‍රයේ (අති විශේෂ) පරිච්ඡේද 10(බී) | 2015 ජුලි 01 සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා කාලසීමාව සඳහා බැංකුව සේවක පාරිශ්‍රමික වලින් රු.397,425 ක මුද්දර බදු අයකරගෙන තිබුණද, ඒවා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. |
| (එ) | 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන රජයේ ගැසට් පත්‍රයේ 10 වන වගන්තිය හා 2006 ඔක්තෝබර් 05 දිනැති අංක 1465/20 දරන රජයේ ගැසට් පත්‍රයේ 19 වන වගන්තිය | (i) බැංකුව ඕනෑම මුදල් හෝ දේපල මත නිකුත් කරනු ලබන රිසිට් පතක් වෙනුවෙන්ම මුද්දර ගාස්තු ගෙවිය යුතුය. කෙසේ වුවද, බැංකුව විසින් එකතු කරනු ලැබූ රු.2,137,332 ක මුද්දර බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීමට අපොහොසත් වී තිබුණි.<br><br>(ii) බැංකුව 2015 ජුලි 01 සිට 2017 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය දක්වා වරින් වර පාරිභෝගිකයන්ට ණය පහසුකම් ලබාදීමේදී අයකල රු.1,739,907 ක මුද්දර ගාස්තු දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. |

(ඒ) බැංකුවේ ණය අයකර ගැනීමේ අත්පොත

(i) 4.1.1 වගන්තිය

2017 දෙසැම්බර් 31 දිනට පවරා ගත් දේපලවල හිඟ අගය රු.22,246,905 ක් විය. වෙන්දේසි පවරාගත් දේපලවලින් සියයට 50 කට සමාන රු.10,927,479 ක් වර්ෂ 10 කට වඩා හිඟව පැවතුණි.

(ii) 4.1.5 වගන්තිය

පවරාගත් දේපල නැවත අගය කිරීම අවම වශයෙන් බාහිර තක්සේරුකරුවකු විසින් සෑම වර්ෂ හතරකට වරක් හෝ අභ්‍යන්තර තක්සේරුකරුවෙකු විසින් සෑම වර්ෂ දෙකකට වරක් සිදුකළ යුතුය. කෙසේ වුවද, රු.6,311,250 ක් වූ පවරා ගත් දේපල වර්ෂ 2-6 දක්වා කාලයක් නැවත අගය කිරීමකින් තොරව පැවතුණි.

(iii) 3.4.7 වගන්තිය

පවරාගත් දේපල වෙන්දේසි කිරීමෙන් ලැබෙන අතිරික්ත මුදල් අදාළ පාර්ශවයන්ට ගෙවිය යුතුය. කෙසේ වුවද, රු.1,294,630 ක් වූ අතිරික්ත මුදල් බැංකුව විසින් අදාළ පාර්ශව 10 දෙනෙකුහට සමාලෝචිත වර්ෂය තුළ ගෙවා නොතිබුණි.

(ඔ) 2007 උපදේශක සේවා මග පෙන්වීම්හි 4.3 මග පෙන්වීම

වර්ෂයකට වඩා ඉක්ම වූ උපදේශක සේවා සඳහා ජාතික ප්‍රතිපත්තිවල දැන්වීම් පළ කල යුතුය. කෙසේ වුවද, බැංකුව මෙම උපදෙස් අනුව ක්‍රියාකර නොතිබුණි.

(ඕ) 2017 මාර්තු 01 දිනැති අංක ජීසීඑල්/2017/225 දරන අභ්‍යන්තර චක්‍රලේඛය

අපෞද්ගලික (impersonal) සහ පොදු ලෙජරයේ ගිණුම් දිනය අවසානයේදී ශුන්‍ය (zero) විය යුතුය. කෙසේ වුවද, ඉන්ටර් සිස්ටම් ජීඑල්, සීබීඑස්, එල්එම්එස් (Inter System SL, CBS, LMS) පොදු ලෙජරය (පොදු ලෙජර අංක 1600100001) සහ ණය රැස්කිරීම් සහ අත්තිකාරම් ගිණුම (පොදු ලෙජර අංක 1330100003) 2017 වර්ෂය අවසානයට ශුන්‍ය වී නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 557 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු.මිලියන 660 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 103 ක එනම් සියයට 16 ක පිරිහීමක් දැක්වුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම වැඩිවීමට සාපේක්ෂව වර්ෂයේ පොලී වියදම සැලකිය යුතු ලෙස වැඩිවීම හා අනෙකුත් මෙහෙයුම් ආදායම අඩුවීම මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

ලබාගත හැකි වූ තොරතුරු අනුව විවිධ අවස්ථාවලදී සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල සාරාංශයක් පහත වගුවෙන් දැක්වේ.

| | 2017 | 2016 (නැවත සකස් කළ) | වෙනස හිතකර/ (අහිතකර) |
|---|---|---|---|
| | ---------- | ----------- | -------------------- |
| | රු.මිලියන | රු.මිලියන | ප්‍රතිශතය |
| පොලී ආදායම | 6,613 | 5,472 | 21 |
| පොලී වියදම | (4,742) | (3,509) | (35) |
| **ශුද්ධ පොලී ආදායම** | **1,871** | **1,963** | **(4)** |
| ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම | 353 | 347 | 2 |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ) | 12 | 108 | (89) |
| **මුළු මෙහෙයුම් ආදායම** | **2,236** | **2,418** | **(7)** |
| ණය හා අනෙකුත් පාඩු සඳහා හානිකරණ ගාස්තු | 25 | (160) | 115 |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම** | **2,261** | **2,258** | **0.13** |
| කාර්ය මණ්ඩල පිරිවැය | 941 | 896 | (5) |
| අනෙකුත් වියදම් | 531 | 514 | (3) |
| **එකතුකළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු වලට පෙර මෙහෙයුම් ලාභය** | **789** | **848** | **(7)** |
| මූල්‍ය සේවා මත වැට් බදු | 232 | 188 | (23) |
| **බදු පෙර ලාභය/ (අලාභය)** | **557** | **660** | **(16)** |
| බදු වියදම | 149 | 177 | 16 |
| **වර්ෂය සඳහා ලාභය** | **408** | **483** | **(15)** |

### 3.2 බැංකුවේ අගය එකතු කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂයේ බැංකුවේ මෙහෙයුම්වල ප්‍රතිලාභය රු.මිලියන 408 ලාභයක් වුවද, ක්ෂය වීම්, සේවක පිරිවැය හා රජයට ගෙවන ලද බදු මුදල සැලකිල්ලට ගත්විට බැංකුව රටට කරන ලද දායකත්වය රු.මිලියන 1,423 ක් වූ අතර පෙර වර්ෂයේ එම අගය රු.මිලියන 1,345 ක් විය. එනිසා, සමාලෝචිත වර්ෂයේ බැංකුවේ අගය එකතු කිරීම රු.මිලියන 78 කින් වැඩි වී තිබුණි.

### 3.3 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------------

**වැදගත් ගිණුම් අනුපාත**

-----------------------------

ලබාගත හැකි වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය සඳහා බැංකුවේ ගිණුම් අනුපාත පිළිබඳ වැදගත් නිරීක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

(අ) 2017 වර්ෂය සඳහා බැංකුව වාර්තා කළ සියයට 5.85 ක් වූ ශුද්ධ ලාභය අනුපාතය අංශයේ සියයට 8.24 ක් වූ අනුපාතයට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ආ) අංශයේ සියයට 1 ක් වූ සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය අනුපාතය හා සසඳන විට බැංකුවේ අනුපාතය සියයට 0.86 ක අඩු ප්‍රතිශතයක් නියෝජනය වූ අතර, එය පෙර වර්ෂයේ අනුපාතයට වඩා සියයට 21.82 කින් අඩු වීමකි.

(ඇ) කොටස් හිමියන්ගේ අරමුදල් සාමාන්‍ය මත ප්‍රතිලාභය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 24 කින් අඩු වී තිබුණි.

(ඇ) පෙර වර්ෂය හා සැසඳීමේදී 2017 වර්ෂය අවසානයට කොටසක ඉපැයීම් සහ කොටසක වෙළඳපල අගය පිළිවෙලින් සියයට 15 කින් හා සියයට 31 කින් අඩු වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සහ පෙර වර්ෂ 04 ක් සඳහා බැංකුවේ ණය සඳහා ස්කන්ධ අනුපාතය පහත දැක්වේ.

| | **2017** | **2016** | **2015** | **2014** | **2013** |
|---|---|---|---|---|---|
| මුළු ණය ගැනීම් (රු.මිලියන) | 7,917 | 8,863 | 9,037 | 6,213 | 5,257 |
| කොටස් හිමියන්ගේ අරමුදල් (රු.මිලියන) | 4,200 | 3,821 | 3,364 | 2,886 | 2,575 |
| ස්කන්ධ මත ණය අනුපාතය | 1.88 | 2.32 | 2.69 | 2.15 | 2.04 |

කොටස් හිමියන්ගේ අරමුදල් සියයට 9.92 කින් වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස පසුගිය වර්ෂය පුරාවට පැවති බැංකුවේ මුළු ණය ගැනීම 2017 වර්ෂය අවසානයට සියයට 11 කින් සුළු වශයෙන් අඩු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

### 4.1 කාර්යසාධනය
-------------------

#### 4.1.1 සැලසුම් කිරීම
-------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බැංකුවේ අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා 2017- 2020 කාලසීමාව සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා සංයුක්ත සැලැස්මේ සඳහන් කර තිබූ ගනුදෙනුකාර තැන්පතු, ණය හා අත්තිකාරම්, ශුද්ධ පොලී ආදායම හා බදු පෙර ලාභය සඳහා වූ ඉලක්ක සහ සමාලෝචිත වර්ෂය අවසානයට තථ්‍ය සංඛ්‍යා අතර සියයට 2 සිට සියයට 51 දක්වා වූ විචලනයන් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | **සංයුක්ත සැලැස්ම අනුව ඉලක්කය** | **තථ්‍ය** | **විචලනය හිතකර/ (අහිතකර)** |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | |
| ගනුදෙනුකාර තැන්පතු | 36,000 | 36,655 | 1.82 |
| ණය සහ අත්තිකාරම් | 34,200 | 34,970 | 2.25 |
| ශුද්ධ පොලී ආදායම | 2,466 | 1,872 | (24) |
| බදු පෙර ලාභය | 1,144 | 557 | (51) |

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට අනුව ශාඛා ජාලය ශාඛා 45 ක් දක්වා වැඩිකර ගැනීමට සැලසුම් කර තිබුණද, කිසිදු ශාඛාවක් සමාලෝචිත වර්ෂය තුළ විවෘත කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට ශාඛා 39 ක් වී පැවතුණි.

### 4.1.2 අක්‍රීය ණය අත්තිකාරම් (NPL)

-------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ණය හා අත්තිකාරම් රු.මිලියන 35,737 ක් වූ අතර ඉන් රු.මිලියන 6,384 ක් හෙවත් සියයට 18.47 ක් අක්‍රීය ණය හා අත්තිකාරම් විය. කෙසේ වුවද, 2016 හා 2015 වර්ෂ අවසානයේදී එය පිළිවෙලින් සියයට 17.58 ක් හා සියයට 22.57 ක් විය.

(ආ) දළ අක්‍රීය ණය හා අත්තිකාරම් අනුපාතය අංශයේ සියයට 4.5 ට වඩා සියයට 18.47 ක සැලකිය යුතු වැඩි ප්‍රතිශතයක් විය.

(ඇ) 2017 වර්ෂයේ ප්‍රදානය කරන ලද රු.742,174,640 ක් වටිනා ණය 2012 ක් අක්‍රීය ණයවලට මාරු කර තිබූ අතර, 2017 වර්ෂය අවසානයට හිඟහිටි ප්‍රාග්ධන අගය රු.727,472,766 ක් විය.

### 4.1.3 සේවක අර්ථසාධ අරමුදලට (EPF) එරෙහිව ලබාදුන් ණය

-----------------------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක අරමුදලට එරෙහිව ලබා දී තිබූ මුළු හිඟහිටි ණය ප්‍රමාණය රු.9,512,770,575 ක් වූ අතර, ඉන් රු.4,154,617,827 ක් හෙවත් මුළු හිඟ වලින් සියයට 43.67 ක් අක්‍රීය ණය ලෙස සලකා තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට රු.45,544,434 ක් වූ සේවක අර්ථසාධක අරමුදල් ණය මාස 18 කට වඩා හිඟහිටි විය. මෙම ණය මුදල් සේවක අර්ථසාධක දායකවලින් අයකර ගැනීමට හැකියාවක් තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම ණය ශේෂ අයකර ගැනීම සඳහා බැංකුව කිසිඳු සතුටුදායක පියවරක් ගෙන නොතිබුණි.

### 4.2 කළමනාකරණයේ දුර්වලතා

-----------------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) උකස්කර පවරා ගත් දේපලවලින් අයකර ගත යුතුව තිබූ රු.2,123,624 ක දේපල විකිණීමෙන් බැංකුව රු.705,356 ක පාඩුවක් දරා තිබුණි.

(ආ) බැංකුව සහාධිපත්‍යය ණය (condominium) ප්‍රචාරණය දැන්වීම් සඳහා රු.1,069,505 ක් වැය කර තිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදුකර නොතිබූ අතර කිසිඳු ප්‍රගතියක්ද පෙන්වා නොතිබුණි.

(ඇ) සාමාන්‍ය පොලී අනුපාතය හා සැසඳීමේදී ස්ථාවර තැන්පතු 15,404 ක් සඳහා වැඩි පොලියක් ලබාදීමෙන් සමාලෝචිත කාලසීමාව තුල අතිරේක පොලී වියදම් ලෙස රු.110,231,835 ක් වැයකර තිබුණි.

(ඈ) බැංකුව අධික පිරිවැය සහිත ස්ථාවර තැන්පත් හා කල්පිරීමේ කාලය වර්ෂ එකකට වඩා අඩු තැන්පත් මත බෙහෙවින් රඳා පැවතුණි. බැංකුවේ මුළු තැන්පතුවලින් සියයට 84 ක් ස්ථාවර තැන්පත්වලින් සමන්විත වී තිබුණි.

(ඉ) පසුගිය වර්ෂ හා සැසඳීමේදී බැංකුවේ බාහිර ශ්‍රේණිගත කිරීම් සැලකිය යුතු ලෙස පිරිහී තිබුණි. පිච් ශ්‍රේණිගත කිරීම් වාර්තා අනුව (Pitch Rating) බැංකුවේ සහතික කල ජාතික දිගුකාලීන ශ්‍රේණිගත කිරීම (Affirmed National Long Term Rating) 2016 වර්ෂයේ බීබීබී (එල්කේඒ) ස්ටේබල් (BBB (lka) stable) වල සිට 2017 වර්ෂයේ බීබීබී(එල්කේඒ) නෙගටිව් (BBB (lka) Negative) දක්වා පිරිහී තිබුණි.

(ඊ) පෙර වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ බැංකුවේ ප්‍රතිලාභ ඉතිරිකිරීමේ ගිණුම් හා ආයතනික ස්ථාවර තැන්පතු (ප්‍රධාන කාර්යාලය) වල සමුච්චිත වර්ධනය පිලිවෙලින් සියයට 6.2 කින් හා සියයට 60.81 කින් අඩු වී තිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන කරුණු**

**---------------------------------**

2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව සේවකයින්ගේ උපයන විට ගෙවීම් බදු (PAYE) රු.21,192,035 ක මුදලක් අදාළ සේවකයින්ගේ පාරිශ්‍රමිකවලින් අඩු කර ගැනීමකින් තොරව බැංකුව විසින් දරා තිබුණි.

**4.4 ආර්ථික නොවූ ගනුදෙනු**

**------------------------------**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බැංකුවේ මානව සම්පත් ක්‍රියාදාමය උත්ශ්‍රේණිගත කිරීම සඳහා 2016 සැප්තැම්බර් මානව සම්පත් සංවර්ධන හා පාලන උපදේශක තනතුරට පුද්ගලයෙක් බඳවාගෙන තිබුණි. කෙසේ වුවද, පත්වීම් ලිපියේ සඳහන් රාජකාරී ඉටුකිරීමට ඔහු අපොහොසත් වී තිබුණු අතර 2016 සැප්තැම්බර් සිට 2018 මාර්තු දක්වා ඔහුට උපදේශක ගාස්තු ලෙස බැංකුව රු.3,830,000 ක් ගෙවා තිබුණි.

(ආ) බැංකුව සීමාසහිත ලංකා විදුලි සමාගමට ආරක්ෂිත තැන්පතු ලබාගැනීමකින් තොරව ප්‍රතිමූල්‍ය ණය පහසුකම් ලබා දී තිබුණි. තවද, මෙම ණය පහසුකම් සම්බන්ධයෙන් 2017 ජනවාරි 01 දිනට රු.731,385 ක් වූ පොලී අයකරගැනීමට බැංකුව අසමත් වී තිබුණි.

**4.5 වෙළඳපොල කොටස**

**----------------------------**

ණය හා අත්තිකාරම් සහ මුළු තැන්පතු පදනම් කරගෙන බැංකුවේ වෙළඳපොල කොටස පහත දැක්වේ.

(අ) ණය හා අත්තිකාරම් පදනම මත වෙළඳපල කොටස

| | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | **2017** | **2016** | **2015** | **2014** | **2013** |
| බැංකුවේ මුළු ණය හා අත්තිකාරම් (රු.මිලියන) | 35,737 | 31,052 | 27,316 | 23,899 | 20,112 |
| වෙළඳපලේ මුළු ණය හා අත්තිකාරම් (රු.මිලියන) | 639,706 | 533,230 | 456,961 | 440,670 | 347,117 |
| බැංකුවේ වෙළඳපල කොටස (ප්‍රතිශතය) | 5.59 | 5.82 | 5.98 | 5.42 | 5.79 |

(ආ) තැන්පතු පදනම මත වෙළඳපල කොටස

| | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | **2017** | **2016** | **2015** | **2014** | **2013** |
| බැංකුවේ මුළු තැන්පතු (රු.මිලියන) | 36,655 | 32,123 | 28,593 | 24,479 | 18,902 |
| වෙළඳපලේ මුළු තැන්පතු (රු.මිලියන) | 974,574 | 846,146 | 764,155 | 709,671 | 617,081 |
| බැංකුවේ වෙළඳපල කොටස (ප්‍රතිශතය) | 3.76 | 3.78 | 3.74 | 3.45 | 3.06 |

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 අනුව බැංකුවේ විෂය පථයට අදාළවන තිරසාර සංවර්ධන අරමුණු ලඟා කරගැනීමට බැංකුව මිනුම් නිර්ණායක හඳුනාගෙන සංවර්ධනය කිරීමට අපොහොසත් වී තිබුණි.

## 6. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 අයවැය පාලනය

අයවැය හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 10 සිට සියයට 121 දක්වා වූ සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය වූ අතර ඒ අනුව අයවැය ඵලදායී අභ්‍යන්තර පාලන උපකරණයක් ලෙස යොදා ගැනීමට බැංකුව අපොහොසත් වී තිබුණි.

## 7. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු බැංකුවේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| වත්කම් කළමනාකරණය | - ගනුදෙනුවේ අන්තර්ගතය පිළිබඳ සැලකිල්ලට ගැනීමකින් තොරව අම්පාරේ ඉඩමක් මෙහෙයුම් කල්බදු ලෙස හඳුනාගෙන තිබුණි. |
| | - ස්ථාවර වත්කම් පද්ධතිය කල්බදු වත්කම් ඇතුළත් කිරීම සඳහා පහසුකම් නොදැක්වීම. |
| | - තොරතුරු තාක්ෂණ ගබඩාවේ (IT stores) මුළු වත්කම් වලින් සියයට 46 හෝ රු.1,379,229 ක් වටිනා පරිගණක උපකරණ වර්ෂ එකකට වඩා නිෂ්ක්‍රියව පැවතිණි. |
| | - මුළු වත්කම්වලින් රු.275,545 හෝ සියයට 40 ක් වටිනා කාර්යාලීය උපකරණ වර්ෂ එකකට වඩා නිෂ්ක්‍රියව පැවතිණි. |
| | - ශාඛාවලින්/ ශාඛාවල සංචලනයන් ස්ථාවර වත්කම් ලේඛනයේ ක්‍රමවත්ව නඩත්තු කර නොතිබුණි. |
| | - ස්ථාවර වත්කම් ලැයිස්තුවලට ඇතුළත් වී තිබුණද, සමහර වත්කම් ශාඛාවල භෞතිකව දක්නට නොලැබිණි. |
| | - මිලදී ගත් දිනය නොසලකා ක්ෂය කිරීම් සිදු කර තිබුණි. |

| | | |
|---|---|---|
| පාරිභෝගික තැන්පතු මත පාලනය | - | පාරිභෝගික කේත නිර්මාණය හා අනුමැතිය දීම වෙන්කර නොතිබුණි. |
| | - | මූලික තැන්පතු සමඟ සමහර ප්‍රතිලාභ ඉතිරිකිරීමේ ගිණුම් විවෘත කර නොතිබුණි. |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මුදල් ආපසු ගැනීම් | - | ATM යන්ත්‍ර මඟින් වෙනත් බැංකු මුදල් ආපසු ගැනීම් සඳහා අවම ශේෂ සීමා කර නොතිබුණි. |
| ගිණුම්කරණය | - | මූල්‍ය ප්‍රකාශන අනුව හා 2016/2017 වර්ෂය සඳහා ආදායම් බදු ගණනය කිරීම අතර ආයෝජන දේපල නැවත අගය කිරීමේ ලාභය රු.3,289,295 ක වෙනසක් නිරීක්ෂණය විම. |
| | - | 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය සේවා ගිණුමේ අගය එකතුකිරීමේ බදු හා ජාතිය ගොඩනැංවීමේ බදු සඳහා පිළිවෙලින් රු.1,371,599 ක ඌන වෙන්කිරීමක් හා රු.1,143,360 ක අධි වෙන්කිරීමක් දක්නට ලැබුණි. |